# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/37 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

6 වැනි වගන්තිය යටතේ නියෝගය

**සේවා සැපයුම්කරුවන් පත් කිරීම**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න වන මම සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම මෙහි පහත I වැනි උපලේඛනයෙහි සඳහන් නියමයන් හා කොන්දේසි ප්‍රකාරව, මෙහි පහත II වැනි උපලේඛනයෙහි සඳහන් සේවා සැපයීම සඳහා සේවා සැපයුම්කරුවකු ලෙස පත්කරනු ලැබූ බව මෙම නියෝගයෙන් පල කරමි.

පියංකර ජයරත්න,
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2013 මාර්තු මස 12 වැනි දින.

*උපලේඛනය I*

*පත් කිරීම සඳහා වන නියමයන් හා කොන්දේසි*

1. මෙහි II උපලේඛනයෙහි සඳහන් සේවා සැපයීමේ දී සේවා සැපයුම්කරු විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ අදාළ වන නීති ප්‍රතිපාදනයන්ටත්, එම පනත යටතේ පනවනු ලබන රීති, රෙගුලාසි සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ටත් අනුව කටයුතු කළ යුතු ය.

2. සේවා සැපයුම්කරු විසින් තම සේවා සැපයුමට අදාලව කලින් කලට අමාත්‍යවරයා විසින් දෙනු ලබන සාමාන්‍ය සහ විශේෂ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

3. සේවා සැපයුම්කරු හට ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් අතුරු බදු දෙනු ලැබූ සියලුම නිශ්චල දේපල සහ චංචල දේපල සේවා සැපයුම්කරු විසින් ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් යථා පරිදි පවත්වාගෙන යා යුතු අතර, එකී දේපල තුන්වන පාර්ශ්වයකට බදු දීම සිදු නොකළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මෙහි සඳහන් දිනෙන් පසුව සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන ගගන නාවික සේවා සම්බන්ධව එළඹෙනු ලබන ගිවිසුම්, එම ගිවිසුමේ මෙයට පරස්පර විරෝධී ප්‍රතිපාදන ඇත්නම් හැර, සේවා සැපයුම්කරු විසින් එකී සේවා සැපයුම්කරු වෙනුවෙන් ඇති කර ගන්නා ලද ගිවිසුම් ලෙස සලකනු ලබන බවට හැර, එකී ගිවිසුම් කිසිවිටෙකත් රජය වෙනුවෙන් හෝ රජය එකී ගිවිසුම් කෙරෙහි බැඳ තැබීමක් සිදු නොවනු ඇත.

5. අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ ලිඛිත ඉල්ලීම මත සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන ගගන නාවික සේවාවන්ට අදාළ පරිපාලන, මෙහෙයුම්, තාක්ෂණික හා මූල්‍යමය තොරතුරු එකී ලේකම් වෙත සැපයිය යුතු ය.

6. සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන සේවාවන් ඊට අදාළ අන්තර්ජාතික ප්‍රමිතීන්ට හා නිර්දේශිත ක්‍රියාදාමයන්ට අනුව සැපයීම උදෙසා සේවා සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, II වැනි උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවා සැපයීම වෙනුවෙන් අදාළ බලපත්‍ර හෝ අවසර පත්‍ර ලබාගත යුතු ය.

7. සේවා සැපයුම්කරු විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව මෙහි පහත II වැනි උපලේඛනයෙහි සඳහන් ගගන නාවික සේවාවන් සැපයීම, වෙනස් කිරීම, තාවකාලිකව හෝ ස්ථිරව නැවැත්වීම සිදු නොකළ යුතු ය.

8. මෙහෙයුම් අවස්ථාවන්වල දී දැරීමට සිදුවන වගකීම් සහ වන්දි වෙනුවෙන් රජයට වගකීම් නොපැවරෙන පරිදි සුදුසු රක්ෂණ ආවරණ සේවා සැපයුම්කරු විසින් ලබාගත යුතු ය.

9. සේවා සැපයුම්කරුගේ ව්‍යවස්ථාපිත හඳුනා ගැනීම, කොටස් ප්‍රාග්ධනය හෝ නම වෙනස් කිරීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

10. සේවා සැපයුම්කරු විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව මෙහි පහත II වැනි උපලේඛනයෙහි සඳහන් කිසිදු ගගන නාවික සේවාවක් පැවරීම හෝ අතුරු බදු දීමක් නොකළ යුතු ය.

## *උපලේඛනය II*

*සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන සේවා*

I. බස්නාහිර පළාතේ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කොළඹ
II. දකුණු පළාතේ පිහිටි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල,
III. බස්නාහිර පළාතේ පිහිටි කොළඹ ගුවන් තොටුපල, රත්මලාන

සහ අමාත්‍යවරයා විසින් කලින් කලට පළකරනු ලබන ගැසට් නිවේදන මගින් සඳහන් කරනු ලබන අනෙකුත් ගගන යාත්‍රාංගනයන් සඳහා,

1. ගුවන් යානා පිරිසිදු කිරීමේ සේවාවන් ඇතුළුව, ඒප්‍රනය මත ගුවන් යානා පිටත් කරවීමට අවශ්‍ය සහාය හෝ උපකරණ හෝ සැපයීම,
2. ගුවන් යානා සඳහා බිම් මෙහෙවර පහසුකම් හෝ සේවාවන් සැපයීම,
3. ගුවන් යානාවලට ආහාර සැපයීමේ සේවාවන් සැපයීම.

03-1152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.